**ශීර්ෂය 166 - ජල සම්පාදන අමාත්‍යාංශය**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 166 - ජල සම්පාදන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අප්‍රේල් 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 09 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජල සම්පාදන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති තොරතුරු සමඟ එකඟ වන බවට සහතික විය යුතු වුවත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල ඇතුලත් සමාලෝචිත වර්ෂයට අදාල තැන්පතු ලැබීම් රු.1,712,060 ක් සහ තැන්පතු ගෙවීම් රු.1,589,597 ක් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයෙහි පිළිවෙලින් රු.1,482,085 ක් සහ රු.1,478,947 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව තැන්පතු ලැබීම් සහ ගෙවීම් එකතුව රු.340,625 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි සටහන් වී තිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂ පිරික්සුම අනුව වසර තුල වූ තැන්පතු ලැබීම් හා ගෙවීම් අගයන් ඇතුලත් කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙල කර ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

(ආ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 ඔක්තෝම්බර් 17 දිනැති පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීමේ බල අංක 134 ප්‍රකාරව අංක 166-01-01-1102/11 දරන වැය විෂය සඳහා රු.500,000 ක පරිපූරක ඇස්තමේන්තු වෙන් කර තිබුණද, එම අගය මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 2(ii) වියදම් ප්‍රකාශයෙහි සටහන් කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් SA-XXX හි ඇතුලත් කර නොමැති බැවින් එම අගයන් නොමැතිව අවසන් ගිණුම් පිළියෙල කර ඇත. | අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

(ඇ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ වාහන 02 කට හා කාර්යාල උපකරණ 03 කට සිදුවී තිබූ හානි හේතුවෙන් රජයට වී තිබුණු එකතුව රු.1,965,742 ක පාඩුව සහ තවදුරටත් අය නොවී පැවති ශේෂයන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (i) හා (ii) ඡේද යටතේ දක්වා නොතිබුණි. | එක් වාහන අනතුරක් සඳහා අලුත්වැඩියා වියදම් රක්ෂණ හිමිකම් මගින් ප්‍රතිපූර්ණය කර ඇති බැවින් රජයට වියදමක් දැරීමට සිදු වී නැත. අනෙක් වාහනයේ අනතුරට අදාළ අලාභය ගෙවීම් කරන ලෙස රියදුරුට දැනුම් දී ඇත. කාර්යාල උපකරණවලට අදාළ තොරතුරු නොමැති බැවින් හෙළිදරව්කර නොමැත. | අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

(ඇ) **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ අංක 7042707 දරන බැංකු ගිණුමේ ශේෂය රු.13,232,474 ක් වී තිබුණු අතර එම අගය මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) හි බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවේ ඇතුළත්කර නොතිබුණි. | විගණනයේදී පෙන්වා දී ඇති කරුණු පිළිගනිමි. | අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 74 ප්‍රකාරව අනපේක්ෂිත තත්ත්වයන් මත ඇතිවන අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් පමණක් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අයදුම් කළයුතු වුවද, ඒ පිළිබඳ නොසලකා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයන් 08 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු.2,740,000 ක් වූ මුළු පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර පැවති අතර වැය විෂයන් 07 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් ඉතිරිවීම් සියයට 17 සිට සියයට 93 ක් දක්වා පරාසයක පැවතුනි. | ජල සම්පාදන අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යය මණ්ඩලයට අදාලව මුළු ප්‍රතිපාදන උපයෝජනය නොවීම, කොරෝනා උවදුර, අමාත්‍යවරුන් තුන් වතාවකදී වෙනස් වීම, රාජ්‍ය වියදම් කළමණාකරණ චක්‍රලේඛ, ඉන්ධන අර්බුදය හා වියදම් මනා අධීක්ෂණයෙන් කළමණාකරණය කිරීම සහ බඳවා ගැනීමට සැළසුම් කළ කාර්යමණ්ඩලයට වඩා අඩු සංඛ්‍යාවකට අනුමැතිය ලැබීම. | පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබා ගැනීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුව සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව පිළිබඳ අවධානය යොමු නොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයන් 79 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් සියයට 12 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ඉන් වැය විෂයයන් 16 ක් සඳහා වෙන්කළ එකතුව රු.83,698,829 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව වැය විෂයන්වල වියදම් පාලනය කිරීම, ඉන්ධන අර්බුදය, කාර්තුව තුලදී අදාල අක්මුදල් නොලැබීම, අමාත්‍ය කාර්යය මණ්ඩලය තෙවතාවක් වෙනස් වීම, රාජ්‍ය වියදම් කළමණාකරණ චක්‍රලේඛවලට අනුව නව ව්‍යාපෘතීන් ආරම්භ නොකිරීම, අමුද්‍රව්‍යවල හිඟතාවය හා මිල ඉහළයාම හේතුවෙන් අනෙකුත් කොන්ත්‍රාත් අපේක්ෂා කල කාල සීමාව තුල නිම කරගැනීමට නොහැකි වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන අවශ්‍යතාව නිශ්චිතව හඳුනාගෙන වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 ඡේදයෙහි දක්වා ඇති උපදෙස්වලට පටහැනිව වැය විෂය අංක 166-2-16-5-2506-0/11 යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.4,622,422 ක බැඳීම් ඇති කර ගෙන තිබුණි. | ජල පිරිපහදු පද්ධතිය රේගුවෙන් නිදහස් කර ගැනීමට අවශ්‍ය ඇස්තමේන්තු මුදල ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත්කර ගැනීමට නොහැකි විය. එබැවින් මෙම ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් කිරීමට සිදුවිය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/01 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ 3.3 ඡේදය හා 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(iv) ඡේදය | - | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් වාහන 04 ක් වසර 02 කට වඩා වැඩි කාලයක සිට අමාත්‍ය කාර්යය මණ්ඩලයේ පරිහරණයට යොදවා තිබුණි. | මුදල් හා මසම්පාදන ක්‍ර ශයේඅමාත්‍යාං අනුමැතිය ලබාගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර අවශ්‍ය වැඩි දුර තොරතුරුද ලබාදී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

### අධිකාර බලය නොමැති ගෙවීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ ජල සම්පාදන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලය ලෙස පත්කළ සහයක කාර්යය මණ්ඩල නිළධාරීන් 15 දෙනෙකු වෙත ලබාදුන් පත්වීම් ලිපිවලට සහ ඔවුන්ගේ පත්වීම් භාර ගැනීමේ ලිපිවලට අනුව පත්වීමේ දිනය 2022 ජුනි 27 වුවත් 2022 මැයි 24 දින සිට සේවය කළ බවට හේතු දක්වමින් විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව එම නිලධාරීන්ට එදින සිට 2022 ජුනි 27 දක්වා කාලපරිච්ඡේදයට අදාළව වැටුප් හා වෙනත් දීමනා ලෙස එකතුව රු.1,402,827 ක් ගෙවා තිබුණි. | 2022 මැයි 24 දින සිට රාජකාරියේ යෙදුනු බැවින් 2022 මැයි 24 දින සිට වැටුප් ගෙවා ඇත. 2022 මැයි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022 ජුනි 27 දිනැතිව පත්වීම් ලබා දෙන ලදී. | නිළධාරීන්ගේ නොසැළකිලිමත්කම හේතුවෙන් රජයට පාඩු සිදු නොවිය යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය ජල සැපයුම් සහ සනිපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ රු.68,097,893 ක ඇස්තමේන්තු පිරිවැයක් මත මැණික්කඩවර ජල සම්පාදන ව්‍යාපෘතිය 2019 ඔක්තෝම්බර් 24 දින ආරම්භ කර තිබුණි. විගණන දිනය වූ 2023 මාර්තු 02 දින වන විට එම ව්‍යාපෘතියේ කාර්යයන් 14 ක් ඉටු කිරීම වෙනුවෙන් රු.28,530,317 ක් ගෙවා තිබුණද මෙම ව්‍යාපෘතිය අවසන් කළ යුතු කාලය පිළිබඳ නිසි පරිදි සැළසුම් සකස් කර නොතිබූ අතර එය ආරම්භකර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වර්ෂ 03 ක් ඉක්මගියද එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක් පමණක් වී තිබුණි. | අනපේක්ෂිත ලෙස පස් කඩා වැටීම් සිදු වීම නිසා සැළසුම් කළ පරි◌ිදි ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් කළ යුතු අතර නිළධාරීන්ගේ නොසැළකිලිමත් කමින් සිදු වී ඇති මෙම පාඩුව පිළිබද අදාල වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුයි. . |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| චීන රජය විසින් ප්‍රදානයක් ලෙස ජල සම්පාදන අමාත්‍යාංශය වෙත භාර දී තිබූ රු.39,183,806 (USD 211,142.40) ක් වටිනා ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය 2022 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර තිබුණි. | අමාත්‍යාංශ ලේකම්වරයා යටතේ පවතින මෙම පහසුකම ප්‍රයෝජනයට ගන්නා ලෙස අමාත්‍යාංශය හරහා පාර්ශවකරුවන් වෙත තුන් වතාවක් සිහිකැඳවීම් කරන ලදී. | මෙම ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය පරිහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතුය. |

## 3.3 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------------- | ----------- |
| (අ) | අමාත්‍යාංශයේ වාහන 04 කට අවස්ථා 05 කදී සිදු වී තිබූ අනතුරු සම්බන්ධයෙන් අදාල අනතුරු සිදු වී වසර 01 ත් 05 ත් අතර කාලයක් ගත වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(1),104(3) හා 104(4) රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඊට අදාළ එකතුව රු.492,280 ක් වූ අලාභ සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන නොතිබුණි. | 2022 වර්ෂයට පෙර සිදු වූ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ 104 පරීක්ෂණ සිදු කර නොමැති අතර අලුත්වැඩියා මුදල රක්ෂණයෙන් ගෙවීම් කර ඇත. 2022 වර්ෂයේ සිට සිදුවන සියළුම අනතුරුවලට අදාලව මු.රෙ 104 පරීක්ෂණ කිරීමට කටයුතු කර ඇත. | මෙම අනතුරු සහ ඒ තුලින් රජයට සිදු වූ පාඩු පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) | අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් වෙත ලබා දී තිබූ තක්සේරු වටිනාකම රු.12,000,000 ක් වූ වාහනයක් 2022 මැයි 09 වන දින සිට රාජ්‍ය අමාත්‍යාංශය අහෝසිවීමෙන් පසු 2022 ජුනි 20 දින අමාත්‍යාංශයට භාර දී තිබුණු අතර එහිදී එම වාහනය අනතුරට ලක්වී තිබූ බව හඳුනාගෙන තිබුණි. ඒ පිළිබඳව නියමිත කාලය තුල පොලීසිය හා රක්ෂණ ආයතනය දැනුවත් කර නොතිබීම හේතුවෙන් අනතුරට අදාල ඇස්තමේන්තුගත අළුත්වැඩියා වියදම වූ රු.572,700 ක් ගෙවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර ඉහත කී පරිදි රජයට සිදුවී ඇති පාඩුවට වගකිවයුතු අය හඳුනාගෙන අයකර ගැනීමට 2023 මාර්තු 27 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මු.රෙ 104 පරීක්ෂණ කමිටු මණ්ඩල වාර්තාව අනුව අලුත්වැඩියා වියදම රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූරණය නොකරන බැවින් අදාළ මුදල රියදුරුගෙන් අයකර ගැනීමට 2023 අප්‍රේල් 30 දක්වා කාලය ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර රජයට සිදු වී ඇති පාඩු ආවරණය කර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) රාජකාරී කටයුතු වෙනුවෙන් අමාත්‍ය කාර්යාලයට ලබා දී තිබූ රු.1,387,192 ක වටිනාකමින් යුතු කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රයක් හා ලැප්ටොප් පරිගණකයක් අමාත්‍යවරයාගේ දේශපාලන කාර්යාලයේ තිබී 2022 මැයි 09 දින රටේ ඇති වූ කලබල හේතුවෙන් විනාශ වූ බව 2022 නොවැම්බර් 22 දිනැති ආරච්චිකට්ටුව පොලිස් ස්ථානාධිපති (වැ.බ) ගේ ලිපිය මගින් අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(1) ජේදය ප්‍රකාරව අදාළ අලාභ හානිය සිදු වූ වහාම පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා මුදල් රෙගුලාසි 103(1)(අ) ප්‍රකාරව අදාළ බලධාරීන් දැනුවත් කර නොතිබුණු අතර එම විනාශය සිදු වී දින 196 කට පසු පොලීසියට පැමිණිලි කර තිබුණු බව පොලිස් වාර්තාවට අනුව අනාවරණය විය. එමෙන්ම එම සිද්ධිය පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කටයුතු සිදුකර වගකිවයුත්තන් හඳුනා ගැනීමට විගණන දිනය වූ 2023 මැයි 02 දින වන විටත් නොහැකි වී තිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩලය පත්කර ඇති අතර වාර්තාව ලද පසු අවශ්‍ය කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර රජයට සිදු වූ පාඩුව අයකරගැනීමට කටයුතු කල යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලයට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 01 ක් හා ද්විතියික මට්ටමේ තනතුරු 06 ක අතිරික්තයක් නිරීක්ෂණය විය. එමෙන්ම එදිනට අනුමත කාර්යය මණ්ඩලය තුළ රියදුරු තනතුරු 14 ක් පැවති අතර තත්‍ය කාර්යය මණ්ඩලය | අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන්ට වෙන් කර ඇති වාහන සඳහා ප්‍රමාණවත් රියදුරන් නොමැති බැවින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් රියදුරන් අනුයුක්ත කර ඇත. පුරප්පාඩු සම්පූර්ණ වූ පසු නැවත රියදුරන් මණ්ඩලය වෙත | අවශ්‍යතාවය අනුව තනතුරු අනුමත කරවා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 10 ක් වූයෙන් එම තනතුරෙහි 04 ක ඌනතාවයක් දක්වා තිබුණද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ලබාගත් රියදුරන් 07 ක්ද අමාත්‍යාංශයේ සේවයේ යොදවා ඇති බැවින් රියදුරන් 03 ක අතිරික්තයක් නිරීක්ෂණය විය. | අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | ජල සම්පාදන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩල තනතුරු සඳහා අනියම් හා කොන්ත්‍රාත් පදනමින් 2022 වර්ෂයේ බඳවා ගනු ලැබූ සහයක කාර්යය මණ්ඩල නිළධාරීන් 15 දෙනා, රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.2 ඡේදය ප්‍රකාරව රජයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිළධාරීන් බව තහවුරු කර ගැනීමට අදාල තොරතුරු ලිපිගොනු තුල නොතිබුණි. | අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ ලිපි ලේඛන අමාත්‍යාංශය වෙත ලැබී නොමැත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලය උපරිමය 15 ක් නොඉක්මවිය යුතු වුවද 2022 මැයි 24 දින වන විට අමාත්‍ය කාර්යය මණ්ඩලය ලෙස නිලධාරීන් 18 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. | අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්ගේ ඉල්ලීම සහ කඩිනම් රාජකාරී අවශ්‍යතාවය පිළිබඳවද අවධානය යොමුකොට අමාත්‍යතුමාගේ ධූරකාලයට පමණක් බල පැවැත්වෙන පරිදි තවත් රියදුරු තනතුරු 03 ක් සඳහා පත්වීම් ලබා දීමට සිදු විය. | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සිදුකර ඇති මෙම පත්වීම් තුලින් රජයට දැරීමට සිදු වී ඇති පාඩුව ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |